**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතිය - 2025**

---

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස් ආර් අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 04.03(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, ප්‍රවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ.

ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතියේ සූදානම වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම සඳහා උපදේශන සේවා සැපයීම සහ කොළඹ තදාසන්න දුම්රිය මාර්ග සංවර්ධනය සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම යන එක් සංරචයක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,654.54 කට සමාන එ.ජ.ඩො මිලියන 11.36 ක් වන අතර ඉන් රු.මිලියන 1,456.50 කට සමාන එ.ජ.ඩො. මිලියන 9.99 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 198.04 ක් ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් 2016 ඔක්තෝබර් 28 වන දින ආරම්භ කර 2022 දෙසැම්බර් 31 වන දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිම කිරීමේ දිනය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2025 දෙසැම්බර් 31 දිනට කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | මුදල (රුපියල් මිලියන) | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයට අනුව, 2025 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වටිනාකම රු. මිලියන 5749.10 කි. කෙසේ වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු. මිලියන 5712.53 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්,එම ශේෂයන් අතර රු. මිලියන 36.57 ක වටිනාකමක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි. | 36.57 | රු.36,566,488 ක වෙනස වන්නේ පෙර කාල පරිච්ඡේද සඳහා ණය පොලිය වන අතර එය සකස් කර 2025 දෙසැම්බර් 31 වන දින අවසන් වන වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ සටහන් කර ඇති අතර එය නිවැරදි වේ. | වෙනස හඳුනාගෙන 2026 වර්ෂය අවසාන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 3.1.1 **ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම්** | | |
| (අ) නාවල අදියර 01 නිවාස සංකීර්ණයේ ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 39 කි. වසර 03 කට වැඩි කාලයක් එහි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන්, ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමෙන් පසු නිවාස ඒකකයක කොන්ත්‍රාත් වටිනාකම රු. 5,000,000 සිට රු. 10,000,000 දක්වා වැඩි වනු ඇත. මේ හේතුවෙන්, නිවාස ඒකක 406ක් වෙනුවට නිවාස 100ක් සඳහා රු. 10,000,000 බැගින් ගෙවීමට 2025 මාර්තු 17 වන දින කැබිනට් අනුමැතිය ලැබුණි. එම අවබෝධතා ගිවිසුම අනුමැතිය ලැබී මාස 06කට පසු කෙටුම්පත් කර 2025 නොවැම්බර් 06 වන දින ප්‍රවාහන අමාත්‍යාංශයට යොමු කළද, 2026 පෙබරවාරි වන විටත් අවබෝධතා ගිවිසුමකට එළඹීමට | නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹගේ මාවත අදියර I නිවාස ව්‍යාපෘතියෙන් නිවාස ඒකක 100ක් මිලදී ගැනීම සඳහා 2025 මාර්තු 17 දිනැති කැබිනට් අනුමැතිය අංක AMP/25/0371/809/031 මගින් අනුමැතිය ලබා දී තිබුණද, නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කළේ, ඉදිරිපත් කරන ලද කෙටුම්පත් අවබෝධතා ගිවිසුමට අනුව, මෙම ඒකක 100 ඉදිකිරීම් අවසන් වූ පසු 2028 ජුනි 30 වන දින වන විට පමණක් ඒකකයකට රුපියල් මිලියන 3.58 ක සංශෝධිත අනුපාතයකට භාර දිය හැකි බවයි. කෙසේ වුවද, ව්‍යාපෘති කාලසීමාව 2027 ජුනි මාසයේදී අවසන් වීමට නියමිත බැවින්, ව්‍යාපෘති කාලසීමාව තුළ නැවත පදිංචි කිරීමේ කටයුතු අවසන් කළ නොහැකි වේ. එබැවින්, ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි, චීන | අවබෝධතා ගිවිසුමකට එළඹීමට සහ නැවත පදිංචි කිරීමේ කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අරමුදල් සහිත නිවාස ව්‍යාපෘතිය යටතේ මහරගම ප්‍රදේශයේ ඉදිකරන ලද නිවාස ව්‍යාපෘතියෙන් නිවාස අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් 2025 නොවැම්බර් 21 වන දින සාකච්ඡාවක් පවත්වන ලදී. 2025 මාර්තු 17 වන දින නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමට එළඹීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දී තිබුණද, අනෙකුත් සම්බන්ධිත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන්, පෙර කාලපරිච්ඡේදය තුළ අවශ්‍ය පියවර අනුගමනය කරන ලද අතර, අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් කරුණු කඩිනමින් සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. | |
| (ආ) නාවල අදියර 02 නිවාස සංකීර්ණයේ නිවාස සඳහා ගෙවිය යුතු රුපියල් 576,000,000 න් සියයට 95 ක් හෙවත් රුපියල් 544,320,000 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගෙවා තිබුණද, අසම්පූර්ණ මලාප්‍රවාහන පද්ධතිය හේතුවෙන් නිවාස ඒකක 144 ක් මේ දක්වා ව්‍යාපෘතියට භාර දී නොතිබුණි. | කැළණිවැලි (KV) දුම්රිය රක්ෂිතයේ පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා ව්‍යාපෘති ප්‍රදේශය අවට වෙනත් මහල් නිවාස සංකීර්ණ නොමැති බැවින්, නාගරික සංවර්ධන අධිකාරිය සතු මහල් නිවාස සංකීර්ණවලින් නිවාස ඒකක ලබා ගැනීමට සිදු වූ බැවින්, මෙම මහල් නිවාස සංකීර්ණයේ අවබෝධතා ගිවිසුම අවස්ථා කිහිපයකදී දීර්ඝ කිරීමට ව්‍යාපෘතියට සිදු විය. මෙම නිවාසවල ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත, නමුත් මලාපවහන පද්ධතියේ ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන බැවින්, ව්‍යාපෘතියට සෘජුවම එයට මැදිහත් විය නොහැක. නියමිත කාලරාමුවට අනුව නිවාස අත්පත් කර ගැනීමේ හැකියාව ව්‍යාපෘති පාලනයෙන් ඔබ්බට ගිය කාරණයක් බවට පත්ව ඇති බැවින්, ඉදිරි කටයුතු අවබෝධතා ගිවිසුම්වලට අනුකූලව සිදු කළ යුතුය. | කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකත්වයන් හේතුවෙන් ව්‍යාපෘතියට සිදුවන අහිතකර බලපෑම අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) නාගරික සංවර්ධන අධිකාරිය ගිවිසුම්වලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය සුදුසු පියවර ගෙන නොතිබූ අතර, 2018 සිට නිවාස ව්‍යාපෘති නිම කිරීමේ දිනය අවස්ථා කිහිපයකදී දීර්ඝ කර 2022 දී නව අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබුණද, කැලණිවැලි මාර්ගයේ මාර්ග අයිතියට අයත් | ගිවිසුමට අනුව, නිවාස ඒකක 384ක් මිලදී ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් (MoU) අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත පදනම්ව, මෙම නිවාස ඒකක 144ක් කොළඹ විශ්වවිද්‍යාලයට නේවාසික පහසුකම් සැපයීම සඳහා වෙන් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, එම නිවාස ඒකක 144 නැවත අත්පත් කර ගැනීම සඳහා 2022 මාර්තු 25 වන දින නව අවබෝධතා | කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකත්වයන් හේතුවෙන් ව්‍යාපෘතියට සිදුවන අහිතකර බලපෑම අවම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදේශ තුළ පදිංචි පවුල් නැවත පදිංචි කිරීම 2025 අවසානය වන විට අවසන් කර නොතිබුණි. | ගිවිසුමකට එළඹීමට සිදු විය. ඒ අනුව, කොළඹගේ මාවත දෙවන අදියර නිවාස ව්‍යාපෘතියෙන් නිවාස ඒකක 144ක් ලබා දීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. කොන්ත්‍රාත්තුව අනුව නිවාස ඒකකවල ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද,යටිතල පහසුකම් (මලාප්‍රවාහන පද්ධතිය/සෙප්ටික් පද්ධතිය) සැපයීමේ ප්‍රමාදයන් හේතුවෙන් නිවාස ඒකක මෙම ව්‍යාපෘතියට භාර දීම ප්‍රමාද විය. එබැවින්, එම වැඩ අවසන් වූ වහාම නිවාස භාර දීමට නාගරික සංවර්ධන අධිකාරිය (UDA) එකඟ වී ඇති බැවින්, අදාළ අවබෝධතා ගිවිසුමේ වලංගු කාලය දීර්ඝ කිරීමට සැලසුම් කර ඇත. එබැවින්, එම කාලය දීර්ඝ කිරීමෙන් ඇති වූ ප්‍රමාදය ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බට ගිය කාරණයක් විය. | |
| 3.1.2 | කැලණිවැලි දුම්රිය රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් වන්දි ගෙවීම් හරහා නැවත පදිංචි කිරීම. | | |
| | (අ) බලපෑමට ලක් වූ පවුල් අතරින්, පවුල් 219 ක ප්‍රතිලාභ සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිමිකම් තක්සේරු කමිටුව (EAC) විසින් තීරණය කර නොතිබූ අතර, පවුල් 05 ක ප්‍රතිලාභ වටිනාකම් තක්සේරු කර නොතිබුණි. | සීවලිපුර සිට පැඟිරිවත්ත දක්වා පවුල් ඒකක 69 න්, දුම්රිය දෙපාර්තමේන්තුව බදු දී ඇති ව්‍යුහයන් 33 ක් පාලන කරන අතර, හිමිකම් තක්සේරු කමිටුව (EAC) හරහා ලිපිගොනු 7 ක් සඳහා තීරණ අවසන් කර ඇති අතර, කොළඹගේ මාවත දෙවන අදියරේ නව නිවාස සඳහා ව්‍යුහයන් 16 ක් තැනීමට නියමිතව තිබේ. අනුමත ව්‍යුහයන් 11 න් 10 ක් සඳහා සංවර්ධන වටිනාකම් ගෙවීම් ලැබී ඇති (එක් එකඟතාවය ප්‍රතික්ෂේප කිරීමක් සහිතව), අතර අනෙක් ව්‍යුහයන් දෙක නීත්‍යානුකූලව ඉවත් කිරීමට හෝ හිමිකම් තක්සේරු කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. මේ අතර, පැඟිරිවත්තේ සිට පාදුක්ක දක්වා වූ කොටස සම්බන්ධයෙන් EAC වෙත ගොනු 145ක් ඉදිරිපත් කර ඇති අතර, ඊට ජාතික මට්ටමේ දුක්ගැනවිලි විසඳීමේ කමිටුවේ නිර්දේශ මත තවදුරටත් සමාලෝචනයට ලක්වෙමින් පවතින ගොනු 3ක් ද ඇතුළත් වේ. මීට අමතරව, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අවශ්‍ය වන IV වන කොටසේ ව්‍යුහයන් සංඛ්‍යාව 6 සිට 5 දක්වා නිවැරදි කර ඇත. එම ව්‍යුහයන් සඳහා තක්සේරු | වන්දි ලබා දීමට සහ නැවත පදිංචි කිරීමේ කටයුතු කිසිදු ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වාර්තා මේ දක්වා ලැබී නොමැති බැවින්, මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කරනු ලැබ තිබේ. | |
| (ආ) 1 වන අදියරෙහි IV වන කොටසේ සංවර්ධන පිරිවැය ලබා දීමට තීරණය කර තිබූ පවුල් 18 ක් සහ ස්වයං ප්‍රතිෂ්ඨාපනය යටතේ නැවත පදිංචි වීමට එකඟ වූ පවුල් 04 ක් ඉවත් කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පියවර ගෙන නොතිබුණි. | පැඟිරිවත්ත සිට පාදුක්ක දක්වා කොටසේ සංවර්ධන පිරිවැය ගෙවීමට නියමිතව තිබූ ව්‍යුහයන් 22 න් ව්‍යුහයන් 18 ක් සඳහා සංවර්ධන වටිනාකම සඳහා ගෙවීම් අවසන් කර ඇත. ව්‍යුහයන් 02 ක් සඳහා ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන්, ජාතික මට්ටමේ දුක්ගැනවිලි විසඳීමේ කමිටුවට යොමු කිරීමෙන් නිර්දේශ ලබා ගත යුතුය. ඊට අමතරව, ව්‍යුහයන් 02 ක බලපෑමට ලක් වූ පුද්ගලයින් ප්‍රතිලාභ ලබා ගැනීමට කැමැත්ත පළ කර නොමැත. තවද, ස්වයංප්‍රතිෂ්ඨාපනය කිරීම යටතේ පැවති ව්‍යුහයන් 04 න් ව්‍යුහයන් 03 ක් සඳහා ගෙවීම් අවසන් කර ඇති අතර, එක් ව්‍යුහයක් සඳහා අවසාන තීරණය 2026 මැයි 05 වන දින පැවති හිමිකම් තක්සේරු කමිටුව විසින් ගනු ලැබිය. ඒ අනුව, අනාගතයේදී එම ව්‍යුහය සඳහා හිමිකම් ලබා දීමට නියමිතය. | වන්දි ලබා දීමට සහ නැවත පදිංචි කිරීමේ කටයුතු කිසිදු ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) නිවාස ඒකක 101 ක් සම්බන්ධයෙන් නොවිසඳුණු ගැටළු පැවති අතර, නඩු කටයුතු හේතුවෙන් පවුල් 26 ක්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) විසින් ඉදිකරන ලද නිවාස 66 ක් සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ කොළඹ මහ නගර සභාව යන දෙකම ඉඩම් අයිතිය ඇදීම හේතුවෙන් නිවාස 9 ක් ඊට ඇතුළත් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන විට නැවත පදිංචි කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය යටතේ අනුමත කරන ලද ප්‍රතිලාභ ප්‍රතික්ෂේප කරමින් දුම්රිය රක්ෂිතය තුළ පවතින අනවසර පදිංචිකරුවන් සහ ව්‍යුහයන් ඉවත් කිරීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට යොමු කර ඇති පවුල් ඒකක අතරින් ඉවත් කිරීමට තවත් ව්‍යුහ 14 ක් ඉතිරිව ඇත. තවද, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සහ කොළඹ මහ නගර සභාවට අයත් ඉඩම් කට්ටිවල පිහිටා ඇති ව්‍යුහයන් සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය යටතේ සිදු කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී ඇත. | වන්දි ලබා දීමට සහ නැවත පදිංචි කිරීමේ කටයුතු කිසිදු ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) බලපෑමට ලක් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ ප්‍රමාදය දුම්රිය මාර්ගයේ සංවර්ධනය තවදුරටත් ප්‍රමාද කර ඇති අතර, වන්දි ගෙවීමෙන් පසු නිදහස් කරන ලද | දුම්රිය රක්ෂිතය තුළ පදිංචි අනවසර පදිංචිකරුවන්ට ප්‍රතිලාභ ලබා දීමෙන් පසු, ඉඩම දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී ඇත. | වන්දි ලබා දීමට සහ නැවත පදිංචි කිරීමේ කටයුතු කිසිදු ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

දුම්රිය රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් නැවත සිදුවීමේ අවදානමට හේතු වී ඇති අතර, තක්සේරු කිරීම් සහ අත්පත් කර ගැනීම් ප්‍රමාද වීම අමතර වියදම් සහ ව්‍යාපෘති පරිපාලන පිරිවැය අඛණ්ඩව ඉහළ යාමට හේතු වී තිබුණි.